**විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 - 2014**

**-----------------------------------------------------------------------**

විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 1 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා බැන්කො බිල්බාඕ විශ්කයා ආජන්ටේරියා එස්.ඒ(බී බී වී ඒ) අතර 2013 ජනවාරි 15 දින එළඹි අංක එස් ආර් එල් -038412 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ නියෝජිතායතනය වේ. සබරගමුව පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදි කිරීම හා ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජල සැපයීම හා එමගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම හා දිළිඳු කම අඩු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,493.66 කට සමාන යූරෝ මිලියන 26.65 ක් විය. ඉන් රු.මිලියන 3,698.06 කට සමාන යූරෝ මිලියන 21.93 ක් සැපයීමට බැන්කො බිල්බාඕ විශ්කයා ආජන්ටේරියා බැංකුව එකඟ වී තිබූ අතර රු.මිලියන 652.60 කට සමාන යූරෝ මිලියන 3.87 ක් සැපයීමට ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (DFCC) එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 143.0 කට සමාන යූරෝ මිලියන 0.85 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 24 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 24 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 නොවැම්බර් 24 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්

ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත් පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැටළු වලින් ඇති වන බලපෑම හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 24.42 කට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 03 ක් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

**2.2.2 නොසැසඳූ ශේෂ**

**-------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ තොරතුරු වලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනට රජයේ දායකය රු.මිලියන 62.28 ක් ලෙස දක්වා තිබුණි.කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 73.98 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරිමට රු.මිලියන 623.48 ක් වූ විදේශ අරමුදල් 2014 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 3,081.30 ක් ලෙස දක්වා තිබුණි.

**3 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**-------------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**-------------------------**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මුල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | | උපයෝජනය කරන ලද අරමුදල් 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා |
|---|---|---|---|---|---|---|---|
| | යුරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යුරෝ.මිලියන | රු.මිලියන | යුරෝ. මිලියන | රු.මිලියන |
| බීබීවීඒ | 21.93 | 3,698.06 | 623.48 | 9.72 | 1,625.25 | 13.30 | 2,257.03 |
| ඩීඑෆ්සීසී | 3.87 | 652.60 | - | - | - | 3.87 | 658.76 |
| ශ්‍රී.ලං.ර | 0.85 | 143.00 | 63.00 | 0.44 | 73.98 | 0.47 | 79.38 |
| | 26.65 | 4,493.66 | 686.48 | 10.16 | 1,669.23 | 17.64 | 2,995.17 |

සැලසුම් කරන ලද ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් වගකීම් දක්වමින් මූල්‍ය හා භෞතික ඉලක්ක අවධාරණය කරමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 57 ක් හා සියයට 78 ක් විය. සිවිල් ඉදිකිරීම් වැඩ සැලසුම් කිරීම, පිරිසිදු නොකළ හා පිරිසිදු කළ ජලය සම්ප්‍රේෂණය, නිල නිවාස ඉදි කිරීම ආදි කාර්යයන් සතුටුදායක ප්‍රගතියක් දක්වා තිබුණද තුළු මහ ටැංකි, ජල පිරිසිදු කිරීම් පිරියත, බිම් ජලාශ හා කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම් ආදී වෙනත් කාර්යයන් 2014 දෙසැම්බර් 31 දිනට මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(ආ) ඉදි කිරීම් සඳහා කොන්ත්‍රාත්කරුට වැඩ බිම භාරදීමට පෙර ඉඩම්වල අයිතිය පවරා ගත යුතු වුවද, ව්‍යාපෘතියේ ජල පිරිසිදු කිරීම් පිරියත, කාර්යාල ගොඩනැගිලි, බිම් ජලාශ හා නිල නිවාස ඉදි කිරීම සඳහා ඉඩම්වල අයිතිය 2015 දෙසැම්බර් 31 දක්වා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයක් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයට අනුව, බෙදා හැරීම් කොන්ක්‍රීට් ජල ටැංකියක් ඉදි කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය ලබා ගැනීමෙන් පසුව කොන්ක්‍රීට් ටැංකිය ඉදි කිරීම සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තු ගත පිරිවැයට පෙර සවි ද්‍රව්‍ය යොදා ගනිමින් ජල ටැංකි 02 ක් ඉදි කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින්

ඉදිරිපත් කරන ලද වගකීම් සහතිකය අනුව, කොන්ක්‍රීට් ජල ටැංකිවල සාමාන්‍ය ඵලදායි ජීවකාලය වසර 50 ක් වූ අතර පෙර සවි ජල ටැංකිවල ඵලදායී ජීව කාලය වසර 20 ක් විය.

(ආ) ලැබුණු තොරතුරු අනුව, ජල පිරිසිදු කිරීම් පිරියතෙහි හා පොම්පකැළේ පොම්පාගාරයේ ඝණ මීටර් 13,000 ක මුළු ධාරිතාවයෙන් සියයට 32.26 ක් සමාලෝචිත වර්ෂය තුළ පරිභෝජනය කර තිබුණි. කෙසේ වුවද, පිරිසිදු කළ ජලය පරිභෝජනය හා පොම්පාගාරය මඟින් බෙදාහැරීම් වැඩි කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ව්‍යාපෘති ගණකාධිකාරි තනතුරක් හා කළමනාකාරණ සහකාර තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014 පෙබරවාරි 11 දින අනුමත කර තිබුණද, අදාළ තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් බඳවා ගැනීමට 2015 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ පොදු ලෙජරය හා වෙනත් මූල්‍ය තොරතුරු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වා තිබුණි.

## 3.5 මූල්‍ය කළමනාකරණය පිළිබඳ ගැටලු

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133 හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 626 අනුව එක් එක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන, පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පවත්වාගෙන යන ව්‍යාපෘතියේ වෙනම ගිණුම් වාර්තා පදනම් කර ගෙන පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙනම මුදල් පොතක් පවත්වා ගැනීමෙන් තොරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපෘති ගිණුම් අංශය විසින් ප්‍රදාන අරමුදල් සපයන ව්‍යාපෘති 12 ක ලැබීම් හා ගෙවීම් සටහන් කිරීම සඳහා එකම මුදල් පොතක් පවත්වා තිබුණි.